(94)

# ශ්‍රී ලංකාවේ ජාතික තරුණ සේවා සභාවේ 'යෞවන සමාජ' වල යෞවනයන් හා ඔවුන්ට දෙනු ලබන නොවිධිමත් අධ්‍යාපනයේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් ; කළුතර දිස්ත්‍රික්කය ඇසුරෙනි.

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධය.

CR

UCLIB
422104

සුනිල් රංජිත් හෙට්ටිහේවා
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 3.

1990

422104 CR

UNIVERSITY OF COLOMBO LIBRARY

## සංක්ෂේපයෙන්.

ඕනෑම රටක සමස්ත සංවර්ධනයෙහි පදනම රඳා පවතින්නේ මානව සම්පත් ඵලදායී ලෙස ආයෝජනය කරලීමේ ශක්‍යතාවය මතය. පාසැල් හැර යන අති විශාල තරුණ කොටස්, කිසියම් සංවර්ධන කාර්යයකට යොමු නොවී නිකරුණේ කාලය ගත කිරීම තරුණ සංවර්ධනය කෙරෙහි මෙන්ම ජාතික සංවර්ධනය කෙරෙහිද බලපාන බරපතල ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාවේ කරන ලද ජනගහන සමීක්ෂණවලින් හෙළි වී ඇති තොරතුරු අනුව යැපෙන්නන්ගේ සංඛ්‍යාවේ ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. 1981 දී යැපෙන්නන්ගේ සංඛ්‍යාව සියයට 65.6 ක් විය. මොවුන් අතුරින් විශාල ප්‍රමාණයක් තරුණයෝ වෙති.

නොදියුණු ලෝකය පමණක් නොව දියුණු ලෝකයද යෞවන කටයුතු පිළිබඳ අද වැඩි අවධානයක් යොමු කර ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1985 'තරුණ වර්ෂය' ලෙස නම් කිරීමෙන් ජාත්‍යන්තර වශයෙන් තරුණයින් කෙරෙහි දක්වන අවධානය සනාථ වෙයි. සහභාගීත්වය, සමගිය හා සහෝදරත්වය ජාත්‍යන්තර තරුණ වර්ෂයෙහි තේමාව කොට ගෙන ඇත. ජාතික සංවර්ධන කාර්යයේදී තරුණ සහභාගීත්වයේ ඇති වටිනාකම අද සෑම රටක්ම පාහේ වටහා ගෙන ඇත.

යෞවන අවශ්‍යතා ඉටුකිරීම, ඔවුන් දැනුවත් කිරීම හා වෘත්තිය මාර්ගෝපදේශයන් ලබාදීම සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනය කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබීම අපහසුය. නොවිධිමත් අධ්‍යාපනයේ අවශ්‍යතාවය මෙහිදී ඉස්මතු වෙයි. යාවජීව අධ්‍යාපන සංකල්පය තුළ අධ්‍යාපනික අභියෝගයන්ම මෙන්ම පොදු සංවර්ධන අභියෝගයන්ට ද මුහුණ දීමේ ශක්තිය ගැබ්ව ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන රාශියක් මගින් නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් රාශියක් දියත් කර ඇත. ජාතික තරුණ සේවා සභාව මේ ආයතන අතර ප්‍රධාන ස්ථානයක් හිමි කර ගෙන ඇත. ජාතික තරුණ සේවා සභාව ශ්‍රී ලංකාවේ තරුණයන්

උදෙසා පවත්වාගෙන යනු ලබන සේවාවන් තිසිසේත්ම අඩුවෙන් තත්සේරු කළ හැකි නොවේ. සභාව සතු අවම සම්පත් තුළින් කරනු ලබන සේවාවන්, සාපේක්ෂව සැලකිල්ලට භාජනය කළයුතුය.

ජාතික තරුණ සේවා සභාවේ විවිධාකාර වැඩසටහන් අතුරින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන වැඩසටහනක් ලෙස 'යෞවන සමාජ' හැඳින්විය හැක. ඉතා උසස් මට්ටමේ අරමුණු හා පරමාර්ථ රාශියක් පෙරදැරි කොට ගෙන යෞවන සමාජ ආරම්භ කරන ලදී. 1984 මැයි මාසය වන විට දෙලක්ෂයකට ආසන්න පිරිසක් යෞවන සමාජ වල සාමාජිකත්වය ගෙන තිබුනි.

යෞවන සමාජ වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටුවන්නේද යන්න සෙවීම ඉතා වැදගත්ය. එහෙත් මේ පිළිබඳ පර්යේෂණ කර ඇත්තේ ඉතා සුළු වශයෙනි. එබැවින් එවැනි පර්යේෂණ කිරීම කාලීන වශයෙන් ඉතා වැ ඩදායකය. රට හේතුව යෞවන පරපුර ජාතියේ ජීවනාලිය වන හෙයිනි. සත්‍ය වශයෙන්ම ඔවුන් ජාතික සංවර්ධනයෙහි පුරෝගාමීන් වන බැවිනි. මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් මතු කර ගන්නා ලද නිරීක්ෂණයන් සාරාංශ කොට පහත දැක්වෙයි.

යෞවන සමාජ වල සාමාජිකත්වය දරන තරුණයෝ, පොදුවේ ගත් විට උගත්හු වෙති. ඔවුහු වැඩි පිරිසක් රැකියා වියුක්තියෙන් පෙළෙති. වෘත්තීය හැකියා සහිත විශාල පිරිසක් සිටින අතර රැකියා මාවතකට මෙතෙක් පිවිසී නැත. ඔවුන්ගේ පවුල් වල මාසික ආදායම් තත්ත්වය එතරම් ප්‍රමාණවත් නැත. ජීවනෝපායක් හැටියට කෘෂිකාර්මික අංශයට යොමුවූ සාමාජිකයින්ගේ සංඛ්‍යාව ඉතා අල්පය.

යෞවන සමාජ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවන අතර යෞවන සමාජ සතු භෞතික සම්පත් ද තිසිසේත් ප්‍රමාණවත් නොවේ.

යෞවන සමාජ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික කටයුතු හා ක්‍රියාකාරකම් වලට ලැබී ඇති අවස්ථා හා අවධානය සීමිතය. තවමත් දේශන ක්‍රමය වැඩි වශයෙන් යොදා ගනී.

යෞවන සමාජ වැඩකටයුතු ක්‍රියාත්මක කිරීමේදී බොහෝ බාධක හා සීමා පැණ නගියි. තරුණ සහභාගීත්වය ප්‍රමාණවත් නොවීම ප්‍රධාන බාධකයක් ලෙස දැක්විය හැකි අතර පරම්පරා ගැටුමද බාධකයක් ලෙස බොහෝ අවස්ථාවල ඉදිරිපත් වී ඇත.

වැඩසටහන් අවසානයේ කිසියම් ඇගයීමක් සිදු කෙරෙන නමුදු, එම ඇගයීම් අර්ථවත් ලෙස, ක්‍රමවත් ලෙස හා ප්‍රමාණවත් ලෙස සිදු නොවේ.

යෞවන සමාජ වැඩසටහන් මගින් සාමාජිකයින් තුළ ඇති කෙරෙන දැනුමෙහි වෙනස ප්‍රමාණවත් නොවේ. සමාජ ජීවිතයට අවශ්‍ය, පුළුල සහ මානය දැනුමක් ඔවුන් තුළ වර්ධනය කළ යුතුව ඇත. පවතින තරඟකාරී ලෝකයට අසහනයකින්, පීඩනයකින් හා චකිතයකින් තොරව මුහුණ දීමට, විවිධාකාර අභියෝග- යන්ට මුහුණ දීමට හැකිවන සේ එම වැඩසටහන් තුළින් ආත්ම විශ්වාසයක් තරුණයින් තුළ ගොඩ නැංවිය යුතුය.

තරුණයින් තුළ ආකල්පමය වෙනසක් සිදුවී ඇති බව කිවහැකිය. ජයග්‍රහණය හා පරාජය, මිත්‍රත්වය, සමගිය හා සහෝදරත්වය, සාමූහික ක්‍රියාකාරකම් හා යෞවන සමාජ වැඩසටහන් පිළිබඳ යහපත් ආකල්ප ඔවුන් තුළ ප්‍රවර්ධනය වී ඇති බව පෙනේ.

යෞවන සමාජ සාමාජිකයින් අතර විවිධ කුසලතා ඇති අය බහුලය. එහෙත් යෞවන සමාජ වලින් ඔවුන් ලබා ඇති කුසලතා ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන් වෘත්තීය පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම කෙරෙහි දැඩි උනන්දුවක් පවතී. ඒ හැරෙන්නට ක්‍රීඩා, සෞන්දර්යය, වැනි අංශ කෙරෙහිද උනන්දුවක් ඇත.

යෞවන සමාජ වැඩසටහන් වලට සහභාගීවීමෙන් තරුණයා තුළ ප්‍රමාණවත් සමාජමය වෙනසක් සිදු වෙයි. අන්තර් පුද්ගල සම්බන්ධතා බහුලව සිදුවන බැවින් ඔවුන් තුළ සිදුවන සමාජමය වෙනස ඉහළය. විවිධ පුද්ගල හා ආයතන අතර කටයුතු පිළිබඳ ඔවුන්ට අවබෝධයක් ඇත. ප්‍රාදේශීය වශයෙන් ද, ජාතික

...RSITY OF C...

වශයෙන් ද, ජාත්‍යන්තර වශයෙන් ද දැනුමක්, අවබෝධයක් මේ වැඩසටහන් වලින් තරුණයින්ට ලැබේ. මේ නිසා සමාජමය වෙනස පෘථුලව සිදුවන බව කිව හැකිය.

තරුණයා තුළ සිදු වී ඇති චර්යාමය වෙනස මධ්‍යස්ථ බව පෙනේ. අවස්ථා කිහිපයකදී හැර ඔවුන්ගේ හැසිරීම් වල යහපත් ස්වභාවයක් දැකිය හැකි විය.

තවදුරටත් තරුණයින් පිළිබඳව අවධාරණය කොට ග්‍රාමීය මට්ටමේ තරුණ සංවිධානයක් ලෙස සලකා එහි ක්‍රියාකාරීත්වය, පාලනය හා ව්‍යුහය, සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමෙන් මීට වඩා උසස් මට්ටමකින් අරමුණු කරා ලංවිය හැකි බව පෙනේ. එවැනි ක්‍රියාකාරීත්වයක් තුළින් තරුණ සංවර්ධනය මෙන්ම ජාතික සංවර්ධනය ද අපේක්ෂිත ආකාරයට සිදුවීමට ඉඩ සැලසෙන බවට සැකයක් නැත.

SITY OF CO